| 11 ශ්‍රේණිය | 62 | S | I |
|---|---|---|---|

# දෙවන වාර පරීක්ෂණය - 2018 ජූලි

## පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය - I

කාලය පැය 01 යි.

**උපදෙස් :-**
- (i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- (ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න. සපයා ඇති පිළිතුරු ලියන පත්‍රයේ ප්‍රශ්න අංකයට අදාළ පිළිතුරු අංකය ඇති කවය තුළ (x) ලකුණ යොදන්න.
- (iii) මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු ගණන 40 කි.

(01) අපරාධ නීතිය යටතට අයත් වන්නේ,
1. විවාහ සම්බන්ධ ගැටලු
2. උරුමයන් පිළිබඳ ගැටලු
3. මත්ද්‍රව්‍ය විකිණීම්
4. වානිජ කටයුතු සම්බන්ධ ගැටලු

(02) අන්තර් ජාතික නීති යටතට ගැණෙන්නේ,
1. මානව හිමිකම් නීතිය
2. ආයෝජන නීතිය
3. සාගර නීතිය
4. ඉහත සියල්ලම

(03) තේසවලාමේ නීතිය පිළිබඳ නිවැරදි වගන්තිය තෝරන්න.
1. මෙය සියලු ම ශ්‍රී ලාංකිය ද්‍රවිඩ ජාතිකයන්ට වලංගු වේ.
2. මෙය බ්‍රිතාන්‍ය යුගයට පෙර සිට පැවැත එන නීතියකි.
3. මෙය භූමියේ චාරිත්‍රය ලෙස හඳුන්වන්නේ නැත.
4. මෙම නීතිය සිවිල් සහ අපරාධ නීතිය යටතට අයත් වේ.

(04) කාදි උසාවිය පිහිටුවන ලද වසර වන්නේ,
1. 1815
2. 1706
3. 1806
4. 1929

(05) ලන්දේසි විසින් ස්ථාපිත කරන ලද අධිකරණ දිස්ත්‍රික්කවලට අයත් නොවූයේ,
1. කොළඹ
2. නුවර
3. යාපනය
4. ගාල්ල

(06) පළාත්බද මහාධිකරණය පිහිටුවන ලද වසර වන්නේ,
1. 1948
2. 1956
3. 1971
4. 1978

(07) ශ්‍රී ලංකාවේ ඇති දිසා අධිකරණ සංඛ්‍යාව වන්නේ,
1. 34
2. 54
3. 8
4. 24

(08) මුල් අවස්ථා අධිකරණ බලය ඇත්තේ,
1. දිසා අධිකරණ
2. මහේස්ත්‍රාත් අධිකරණය
3. මහාධිකරණ
4. පළාත්බද මහාධිකරණ

(09) දිසා අධිකරණය සතු බලතල වන්නේ
- A විවාහ සම්බන්ධ නඩු
- B ආදායම් පිළිබඳ නඩු
- C රීටි ආඥා නිකුත් කිරීම
- D ඉඩම් නඩු

1. A, B හා C සත්‍ය වේ
2. A, B හා D සත්‍ය වේ.
3. B, C හා D සත්‍ය වේ
4. ඉහත සියල්ල ම

(10) ශ්‍රී ලංකාවේ උත්තරීතර නීතිය කුමක් ද?

1. අන්තර් ජාතික නීතිය
2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා
3. සිවිල් නීතිය
4. අපරාධ නීතිය

(11) පහළ අධිකරණවල විනිශ්චයකාරවරු පත් කරනු ලබන්නේ,

1. ජනාධිපති
2. අගමැති
3. පාර්ලිමේන්තුව
4. අධිකරණ සේවා කොමිෂන් සභාව

(12) අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන් සංඛ්‍යාව වන්නේ,

1. 2
2. 3
3. 4
5. 5

(13) රාජ්‍ය මන්ත්‍රණ සභාව ස්ථාපිත කරන ලද්දේ,

1. 1910 දීය
2. 1921 දී ය
3. 1931 දීය
4. 1947 දී ය

(14) ඒකීය ආණ්ඩු ක්‍රමයක ප්‍රධාන ලක්ෂණයක් නොවන්නේ,

1. මධ්‍යම ආණ්ඩුවේ උත්තරීතරභාවය
2. අතිරේක ස්වාධිපති ආයතන ආණ්ඩුක්‍රම තුළ නොමැති වීම
3. ස්වාධීන පාලන ඒකක දක්නට ලැබේ.
4. ඉහත සියල්ලම නිවැරදි වේ.

(15) පාලන කටයුතු සඳහා පොළොන්නරු යුගයේ දී ලංකාව බෙදා තිබූ කොටස් ගණන වන්නේ,

1. 3
2. 4
3. 5
4. 6

(16) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට තෝරා පත් කරන මන්ත්‍රීවරු ගණන වන්නේ,

1. 32
2. 29
3. 26
4. 31

(17) දැනට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන මහනගර සභා ගණන

1. 41
2. 23
3. 271
4. 25

(18) ඔම්බුඩ්ස්මන් තනතුර ඇති කරන ලද වසර වන්නේ,

1. 1948
2. 1972
3. 1978
4. 1994

(19) 1972 ශ්‍රී ලංකා පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ඇති කළ තත්ත්වයක් වන්නේ,

1. අග්‍රාණ්ඩුකාර ධුරය අහෝසි කිරීම
2. විධායක ජනාධිපති ප්‍රමුඛ අගමැති සහ අමාත්‍ය මණ්ඩලයක් හඳුන්වා දීම
3. රාජ්‍ය සේවා කොමිෂන් සභාව නැවත ස්ථාපිත කිරීම
4. අධිකරණ සේවා කොමිෂන් සභාව නැවත ස්ථාපිත කිරීම

(20) 1965 දි බලය බෙදීමට ගත් උත්සහයක් වන්නේ,

1. රට සභා ඇති කිරීම
2. බණ්ඩාරනායක - චෙල්වනායගම් ගිවිසුම
3. දිස්ත්‍රික්ක සභා ඇති කිරීම
4. දිස්ත්‍රික්ක සංවර්ධන සභා පිහිටු වීම

(21) මහනගර සභාවක ප්‍රධානියා වන්නේ,

1. නගරාධිපති
2. සභාපති
3. මහ ඇමතිවරයා
4. ආණ්ඩුකාරවරයා

(22) බ්‍රිතාන්‍ය අයිතිවාසිකම් පිළිබඳ පනත සම්මත වූයේ,

1. 1215 2. 1689 3. 1776 4. 1789

(23) වැරදි වගන්තිය තෝරන්න.

1. මරණ දඬුවම අහෝසි කිරීමේ සම්මුතියට ශ්‍රී ලංකාව අත්සන් තබා ඇත.
2. මානව අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශ්ව ප්‍රකාශනය ඉදිරිපත් කරන ලද්දේ 1948 දී ය.
3. 1979 දී (CEDAW) සම්මුතිය ඇති කරන ලදී.
4. මානව අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනයයේ වගන්ති 20 ක් ඇත.

(24) ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය මූල ධර්ම කොපමණ ගණනක් මත පදනම් වී ඇත් ද?

1. 3 2. 4 3. 5 4. 6

(25) පරිසර සංරක්ෂණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ප්‍රධාන නීතිය වන්නේ,

1. පරිසර අධිකාරිය ගනු ලබන නිති රීති
2. කැදෑ පණත
3. වන සංරක්ෂණ පනත
4. ජාතික පාරිසරික පනත

(26) මූලික අයිතිවාසිකම් කඩ වූ විට පැමිණිලි කළ යුතු පුද්ගලයෙක් හෝ ආයතනයක් වන්නේ

1. ඔම්බුඩ්ස්මන්වරයා 2. මානව හිමිකම් කොමිෂන් සභාව
3. ශ්‍රේෂ්ඨාධිකරණය 4. ඉහත සියල්ලම

(27) ''කෙනෙකුට සැරයටියක් වනමින් පාරේ ගමන් කළ හැකි වුවත්, එම නිදහස අනෙකාගේ නාසය ළඟින් කෙළවර විය යුතුය.'' මෙහි අර්ථය කුමක් ද?

1. සැරයටියක් වනමින් රිසි සේ සැමවිටම යා නොහැක.
2. තමාගේ නිදහසින් අනෙකාගේ නිදහසට බාධා නොවිය යුතු ය.
3. නිදහස රිසි සේ භාවිතා කළ හැක.
4. සැරයටියක් වනමින් පාරේ ගමන් කළ නොහැක.

(28) සදාචාරාත්මක යුතුකමක් නොවන්නේ,

1. පොදු දේපළ ආරක්ෂා කිරීම 2. පූජක උතුමන්ට ගරු කිරීම
3. වැඩිහිටියන්ට සැලකීම 4. ගුරුවරුන්ට සැලකීම

(29) මූලික අයිතිවාසිකම් පිළිබඳ තොරතුරු සඳහන් කර ඇත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කුමන පරිච්ඡේදයේ ද?

1. I වන 2. II වන 3. III වන 4. IV වන

(30) මූල්‍ය ගනුදෙනු වඩා ක්‍රමවත් කිරීම සඳහා ස්ථාපනය කර ඇති සංවිධානය වන්නේ,

1. උතුරු ඇමරිකානු නිදහස් වෙළඳ ගිවිසුම
2. යුරෝපා සංගමය
3. දකුණු ආසියානු වරණාත්මක වෙළඳ ගිවිසුම
4. බෙංගාල මුහුදු තීරය අවට රටවල් පිහිටුවා ගත් ආර්ථික සහයෝගිතා සංගමය

(31) සාර්ව ගැටුමක් නොවන්නේ,

1. ජනවාර්ගික ගැටලු 2. ආගමික ගැටලු
3. පවුල් අතර ගැටුම් 4. වෘත්තිය සමිති අතර ගැටුම්

(32) සේව්‍ය සේවක දෙපාර්ශවය අතර ගැටලු විසඳීමට යොදා ගන්නා ක්‍රමයක් වන්නේ,

1. මැදිහත් කරණය 2. සහමන්ත්‍රණය
3. සමථකරණය 4. බේරුම් කිරීම

(33) ගැටුම් සම්බන්ධ චර්යා....

1. සහයෝගිකාරී වේ
2. බලහත්කාරී වේ
3. ප්‍රචණ්ඩකාරී වේ
4. ඉහත සියල්ල සත්‍ය වේ.

(34) ගෝලීකරණයේ ධනාත්මක බලපෑමක් වන්නේ,

1. විදේශ ආයෝජකයින් පැමිණීම
2. විවිධ කලාපීය සංවිධාන ඇති වීම
3. අකාර්යක්ෂම කර්මාන්ත වෙළඳපොළෙන් ඉවත් වීම
4. ඉහත සියල්ලම

(35) ශ්‍රී ලංකාවේ සංවර්ධනය පිළිබඳව ඇති දර්ශක පිළිබඳ නිවැරදි පිළිතුර තෝරන්න.

1. ශ්‍රී ලංකාවේ ළදරු මරණ අනුපාතිකය අනිකුත් දකුණු ආසියාතික රටවලට වඩා අඩු වේ.
2. ඉන්දියාවේ සාක්ෂරතාවය ශ්‍රී ලංකාවේ සාක්ෂරතාවයට වඩා ඉහළ අගයක් ගනු ලැබේ.
3. ශ්‍රී ලංකාවේ උපත් අනුපාතිකය ඉහළ අගයක් ගනු ලැබේ.
4. ඉහත සියල්ල නිවැරදි නොවේ.

(36) 1978 සිට 1993 දක්වා ශ්‍රී ලංකාවේ ආර්ථිකය පිළිබඳ නිවැරදි ප්‍රකාශනය වන්නේ,

1. ආනයන අපනයන සීමා ලිහිල් කිරීම
2. ආවෘත ආර්ථික ප්‍රතිපත්ති ඇති කිරීම
3. සලාක ක්‍රමයක් ක්‍රියාත්මක වීම
4. විනිමය පාලන නීති දැඩි වීම

(37) එක්සත් ජාතීන්ගේ සංවිධානය 2000 දී පැවැත් වූ සහස්‍රක සමුළුවේ දී හඳුන්වා දුන් සංවර්ධන ඉලක්ක ගණන

1. 5 2. 6 3. 8 4. 10

(38) ධනවාදි ආර්ථික ලක්ෂණ දැඩිසේ දක්නට ලැබෙන්නේ,

1. සිංගප්පූරුව
2. උතුරු කොරියාව
3. කියුබාව
4. ඉහත සියලු ම රාජ්‍යයන්

(39) ආර්ථිකයේ සිදුවන ක්‍රියාවලින් බෙදිය හැකි කොටස් ගණන වන්නේ,

1. 2 2. 3 3. 4 4. 5

(40) භාණ්ඩ හා සේවා සැපයීමේ දි මිනිසා විසින් යොදවනු ලබන උපකරණ හඳුන්වන්නේ,

1. භූමිය
2. ශ්‍රමය
3. ප්‍රාග්ධනය
4. ව්‍යවසායකත්වය

| II ශ්‍රේණිය | 62 S II |
|---|---|

## දෙවන වාර පරීක්ෂණය - 2018 ජූලි

**පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය - II** කාලය පැය 02 යි.

■ පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකටත් පිළිතුරු සපයන්න.

(01) කෙටි පිළිතුරු ලියන්න.

i. නීතියේ ගුණාංග 4 ක් ලියා දක්වන්න. (ල. 2)

ii. හෙළ රජ දවස පැවැති පළාත් පාලන ආයතන වර්ග 4 ක් ලියන්න. (ල. 2)

iii. කෝල්බෘක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යටතේ ව්‍යවස්ථාදායක සභාවේ නිලලත් හා නිලනොලත් සාමාජිකයින් ගණන වෙන වෙනම ලියන්න. (ල. 2)

iv. නිදහස ලැබීමට පෙර ශ්‍රී ලංකාවේ බලය බෙදීමට ගත් උත්සහයන් 2 ක් ලියන්න. (ල. 2)

v. 1980 වර්ෂයේ දී සුළු නගරසභා සහ ගම්සභා අහෝසි කර ඒ වෙනුවට පිහිට වූ පළාත් පාලන ආයතනය කුමක් ද? (ල. 2)

vi. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව රජයේ ප්‍රධානියා වන්නේ කවුද? (ල. 2)

vii. වර්තමාන ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන වර්ග 2 ක ලියන්න. (ල. 2)

viii. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ශ්‍රී ලංකාවේ අවසාන හා ඉහළම උසාවිය ලෙස පිළිගන්නේ කුමක් ද? (ල. 2)

ix. ඒකීය ආණ්ඩුවක් යනු කුමක් ද? (ල. 2)

x. 1833 - 1924 කාල සීමාවල දී හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණවල දැකිය හැකි දුර්වලතා 2 ක් ලියන්න. (ල. 2)

(02) ආණ්ඩුවේ විවිධ ස්තර ඇත. මෙම ස්ථර සතුව විවිධ කාර්යයන් ඇත. එසේම නිදහසින් පෙර හා පසුව ද විවිධ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ සිදු වී ඇත.

i. සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය යටතේ සිදු කරන ලද වෙනස්වීම් 4 ක් ලියන්න. (ල. 2)

ii. අ) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් සිදු වූ වෙනස්වීම් 4 ක් ලියන්න. (ල. 2)

ආ) ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන අතීතයේ සිට පැවත ඇත. බ්‍රිතාන්‍ය යුගයේ පැවති පළාත් පාලන ආයතන සඳහා උදාහරණ 2 ක් ලියන්න. (ල. 2)

iii. අ) වර්තමානයේ පළාත් සභා සහ පළාත් පාලන ආයතන පිහිටු වීමට හේතු වූ කරුණු 4ක් ලියන්න. (ල. 2)

ආ) බලය විමධ්‍යගත කිරීමේ දී මතුවන ගැටලු 4ක් සඳහන් කරන්න. (ල. 2)

(03) රජයේ ප්‍රධානියා ද, විධායකයේ ප්‍රධානියා ද සන්නද්ධ සේවාවන්හි සේනාධිනායකයා ද වන්නේ ජනාධිපතිවරයාය.

i. වර්තමාන ජනාධිපතිවරයා, සතු ව්‍යවස්ථාදායක බලතල 4ක් ලියන්න. (ල. 2)

ii. අ) ව්‍යවස්ථාදායකය සතු බලතල 4ක් ලියන්න. (ල. 2)

ආ) අධිකරණයේ බලතල 4ක් ලියන්න. (ල. 2)

iii. අ) මහ නගර සභාවලට පැවරී ඇති බලතල 4ක් ලියන්න. (ල. 2)

ආ) පළාත් සභාවල සහ පළාත් පාලන ආයතනවල ප්‍රයෝජන 4ක් ලියන්න. (ල. 2)

(04) අයිතිවාසිකම් සියලු දෙනාටම සමානව හිමි විය යුතුය.

i. මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ අඩංගු අරමුණු 2ක් ලියන්න. (ල. 2)

ii. අ) සිවිල් අයිතිවාසිකම් හතරක් පැහැදිලි කරන්න. (ල. 2)

ආ) දේශපාලන අයිතිවාසිකම් 4 ක් පැහැදිලි කරන්න. (ල. 2)

iii. ආර්ථික සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය පැහැදිලි කරන්න. (ල. 4)